සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / ALL RIGHTS RESERVED

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

චිත්‍ර කලාව	I
சித்திரக்கலை	I
Art	I

51 S I

II කොටස

* මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත ය.
* '**අ**' කොටසින් ප්‍රශ්න **දෙකක්** හා '**ආ**' සහ '**ඉ**' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
(අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

'අ' කොටස

(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

1. සම්භාව්‍ය කලා සම්ප්‍රදාය ගුරු කොට ගත් අනුරාධපුර හා පොළොන්නරු යුගයන් හි චිත්‍ර ශෛලිය මහනුවර රාජධානි සමයේ දී වෙනස් මගකට යොමු විය.

(i) අනුරාධපුර යුගයේ සම්භාව්‍ය චිත්‍ර කලාව දක්නට ලැබෙන ස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) පොළොන්නරුවේ තිවංක පිළිමගෙයි දක්නට ලැබෙන චිත්‍ර අතර 'බුදුරජාණන් වහන්සේ සංකස්ස නුවරට වැඩම කිරීම' සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) මහනුවර චිත්‍ර සම්ප්‍රදාය තුළ දෙගල්දොරුව විහාරයේ හා දඹුල්ල විහාරයේ දක්නට ලැබෙන 'මාර පරාජය' සිතුවම් දෙක පිළිබඳව සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි.)

2. ගම්පොළ රාජධානි සමය චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ රැසක් දැයට දායාද කළ සමයකි.

(i) ගම්පොළ යුගයේ හමුවන වාස්තු විද්‍යා ශිල්පීන් **දෙදෙනකු** සඳහන් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ගඩලාදෙණි විහාරයේ දක්නට ලැබෙන 'විජයොත්පාය' නම් වූ අගනා වාස්තු විද්‍යා නිර්මාණය පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05 යි.)

(iii) දැව කැටයම් ඇසුරෙන් අලංකාර වූ ඇම්බැක්කේ දේවාලය ගම්පොළ යුගයේ හමුවන විශිෂ්ටතම කලාගාරයකි. එහි දක්නට ලැබෙන කැටයම් පිළිබඳව වර්ගීකරණය, මාධ්‍ය භාවිතය, ශිල්පක්‍රම හා ශිල්පීය කුසලතා ඇතුළත් විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි.)

3. හින්දු ආගමික සංකල්ප මත පදනම්ව නිර්මාණකරණයේ යෙදීම පොළොන්නරු යුගයේ වූ විශේෂිත ලක්ෂණයක් විය.

(i) පොළොන්නරු යුගයේ නිම වූ ලෝකඩ මූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) අංක 1 ගිව දේවාලයේ ගෘහ නිර්මාණ ලක්ෂණ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) පොළොන්නරු යුගයේ ඉදි වූ 'ථූපාරාම පිළිමගෙය' හින්දු ආගමික ගෘහ නිර්මාණ ලක්ෂණ අනුව නිම වූ බෞද්ධ සිද්ධස්ථානයකි. එහි ආභාසය, සැලැස්ම, මාධ්‍ය භාවිතය හා බාහිර ලක්ෂණ ඇතුළත්වන පරිදි විමසීමක් කරන්න. (ලකුණු 08 යි.)

[දෙවැනි පිටුව බලන්න

'ආ' කොටස

(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

4. විවිධ යුගයන් හි පැවති ඉන්දීය සිතුවම් කලාව එකිනෙකට සුවිශේෂී වූ ලක්ෂණ සහිතව වර්ධනය වූවකි.

(i) අජන්තා සිතුවම් පාදක කොට ගෙන ක්‍රි.ව. 450 ට පෙර හා පසු ඇඳි වූ ලෙන් වර්ග **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ලොමස ඍෂිගේ ගුරු කොටගත් මෝගල් සිතුවම් සම්ප්‍රදායේ එන 'බාබුර් අධිරාජයාගේ උද්‍යාන නිරීක්ෂණය' සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) ඉන්දීය කලා සම්ප්‍රදායයන් තුළ කාන්තා රූප නිර්මාණයේ දී ඊට සුවිශේෂී වූ විවිධතා දක්නට ලැබේ. අජන්තා සිතුවම් හි 'අප්සරා රූප' හා රාජ්පුට් සිතුවම් කලාවේ දක්නට ලැබෙන 'රාධා' සිතුවම් පිළිබඳ සංසන්දනාත්මකව ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි.)

5. ක්‍රි.පූ. 25 සිට ක්‍රි.ව. 320 තෙක් අමරාවතිය මූලස්ථානය කොට ගෙන බිහි වූ කලාව 'අමරාවති කලාව' නම් වේ.

(i) අමරාවතියෙන් හමුවන චිත්‍රාකාර පුවරු කැටයම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) ඉන්දීය අමරාවතී කැටයම් අතර එන 'මහාමායා සිහිනය' කැටයම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) ඉන්දීය අමරාවතී සම්ප්‍රදායේ කැටයම් අතර හමුවන බුදු සිරිතේ සිද්ධීන් ඇතුළත් ස්ථම්භ කැටයමෙහි අන්තර්ගතය හා ශිල්පීය කුසලතා පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි.)

'ඉ' කොටස

(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

6. උපස්තිථිවාදයෙන් පසු බිහි වූ නව ප්‍රවණතාව වූයේ පශ්චාත් උපස්තිථිවාදයයි.

(i) පශ්චාත් උපස්තිථිවාදය බිහිවීමට තුඩුදුන් හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි.)

(ii) 'අප එන්නේ කොහි සිට ද?, අප කවුරු ද?, අප යන්නේ කොහාට ද?' (Where do we come from?, Who are we?, Where are we going?) යන පෝල් ගොගැන්ගේ (Paul Gauguin) සිතුවම පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) වින්සන්ට් වැන්ගෝ (Vincent Van Gogh) ශිල්පියාගේ 'අර්තාපල් බුදින්නෝ' (The Potato Eaters) සහ 'තරු පිරි රෑය' (The Starry Night) එකිනෙකට වෙනස් වූ සිතුවම් දෙකකි. සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 08 යි.)

7. ඊජිප්තුවේ හමු වූ කලා අංග යුගයෙන් යුගයට වෙනස්වීම්වලට භාජනය වෙමින් වර්ධනය විය.

(i) පිරමීඩය ඊජිප්තුවේ විශේෂ වාස්තු විද්‍යා නිර්මාණයකි. එය වර්ධනය වූ අවස්ථා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි.)

(ii) නව රාජධානි යුගයට අයත් චිත්‍රකලා නිර්මාණයක් වූ 'නාට්කාංගනාවෝ සහ සංගීතඥයෝ' (Musicians and Dancers) සිතුවම පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 05 යි.)

(iii) ඊජිප්තුවේ දක්නට ලැබෙන ප්‍රධාන දේවස්ථාන වන ලක්සෝර් (Luxor) හා අබුසිම්බල් (Abu Simbel) දේවස්ථාන පිළිබඳ පදනම් වූ සංස්කෘතික පසුබිම, මාධ්‍ය භාවිතය, ආකෘතිය හා බාහිර ලක්ෂණ ඇතුළත් සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි.)

* * *